## පළිබෝධනාශක වල විෂ සහිත භාවය

- ලේබලයේ ඇති සංඥා වචන වලින් විෂ තත්වයන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක.

ප්‍රවේශම් වන්න **(Caution)** - අඩු විෂ භාවයක් පෙන්වයි
අවවාදයයි **(Warning)** - තරමක විෂ භාවයක් පෙන්වයි
අනතුරුදායකයි **(Warning)** - ඉතා විෂ සහිතයි




- පළිබෝධනාශක නිසා ඇතිවන සෞඛ්‍යමය ගැටළු නිරාවරණය වන ප්‍රමාණය හා විෂ භාවය මත රඳා පවතී
- ඉතා විෂ අඩු පළිබෝධනාශක වුවද විශාල ප්‍රමාණයකට නිරාවරණය වූ විට අනතුරුදායක වේ

## පළිබෝධනාශක අනතුරු අවම කර ගැනීම සඳහා

- හැකි සෑම විටම පළිබෝධනාශක භාවිතය අවම කරන්න.
- පළිබෝධ පාලනයට ස්වභාවික ජෛව පාලන ක්‍රම අනුගමනය කරන්න.

කෘෂි රසායන යෙදීමට සුදුසුතම අවස්ථාව වන්නේ පැහැබර කාලගුණයක් පවතින උදය කාලයයි.

## පළිබෝධනාශක භාවිතා කර අවසන් වූ පසු

- උපකරණ හොඳින් පිරිසිදු කරන්න.
- උපකරණ සෝදන ජලය ජල මූලාශ්‍රවලට මුදා නොහරින්න.
- භාවිතා කළ ඇඳුම් සෝදා හොඳින් පිරිසිදු වන්න.

## හිස් බඳුන් බැහැර කිරීමේදී

- හිස් බඳුන් තෙවරක් හොඳින් සෝදා එකතු කිරීමේ මධ්‍යස්ථානවලට භාර දෙන්න.
- හිස් බඳුන්, ළිං, කාණු පද්ධති හෝ වෙනත් ජල මූලාශ්‍ර අසල වැළලීම සිදු නොකරන්න.

**පළිබෝධනාශක ඉසීමෙන් පසු අස්වනු නෙළීමට අවම වශයෙන් දින 14 ක කාලයක් ගත විය යුතුයි.**

# විෂ වීමකදී

**රෝගියා හැකි ඉක්මණින් ආසන්නම රෝහල වෙත රැගෙන යන්න**

**0112- 686-143**
**0112- 691- 111**
**දිගුව 2430**

**ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය**
**ශ්‍රී ලංකා ජාතික රෝහල**

npdic.nhs@gmail.com
infotoxlanka@gmail.com
http://www.toxbaselanka.info
https://www.facebook.com/ NTPICSL
https://twitter.com/ PoisonCenterSL

**ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි.**
**අනුග්‍රහය සෞඛ්‍ය අමාත්‍යාංශය මගිනි.**

# ආරක්ෂාකාරී පළිබෝධනාශක භාවිතය



ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

## ආරක්ෂාකාරී පළිබෝධනාශක භාවිතය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සඳහා පළිබෝධනාශක බහුලව භාවිතා වේ. පළිබෝධනාශක පරිහරණය කිරීමේදී නිවැරදි භාවිතය පිළිබඳ දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ.

## පළිබෝධනාශක ආරක්ෂාකාරීව පරිහරණය කරන අයුරු

### මිළදී ගැනීමේදී

- කෘෂි උපදේශක නිලධාරියාගෙන් උපදෙස් ලබා ගන්න.
- කල් ඉකුත් වීමේ දිනය පිළිබඳ සැළකිලිමත් වන්න

### ප්‍රවාහනයේදී

- ඒවායේ මුල් ඇසුරුම් තුලම රැගෙන යන්න
- පෙරලීම් හා කාන්දුවීම් සිදුනොවන පරිදි ගෙන යන්න.
- සතුන්, පාරිභෝගික භාණ්ඩ, ආහාර වැනි දෑ සමග ප්‍රවාහනය නොකරන්න



### ගබඩා කිරීමේදී

- මුල් ඇසුරුම් තුළම ගබඩා කරන්න.
- මුල් දවටන/ ලේබල ඉවත් නොකරන්න.
- ආහාර පාන තිබූ හිස් බඳුන්වල පළිබෝධනාශක ගබඩා නොකරන්න.
- පළිබෝධනාශක හිස් ඇසුරුම් තුළ ආහාර ගබඩා නොකරන්න.
- ආහාර ද්‍රව්‍ය සමග එකට ගබඩා නොකරන්න.
- පළිබෝධනාශක කුඩා ළමයින්ගෙන් ඈත්කර තබන්න.



- ඉඩ් යතුරු දමා වෙනම ස්ථානයක ගබඩා කරන්න.



භාවිතයට පෙර ලේබලය සහ උපදෙස් පත්‍රිකාව හොඳින් කියවන්න. උපදෙස් පිළිපදින්න.




### මිශ්‍ර කිරීමේදී

- මිශ්‍ර කිරීමේදී රබර් අත්වැසුම් භාවිතා කරන්න.
- පළිබෝධනාශක අතින් මිශ්‍ර කිරීම අනතුරුදායකය. ඒ සඳහා ලී දඬු භාවිතා කරන්න.



### පළිබෝධනාශක ඉසීමේදී

- ඉසීමට භාවිතා කරන උපකරණ හොඳ තත්ත්වයේ තිබේ දැයි පරීක්ෂා කරන්න.
- පළිබෝධනාශකය ඉසීමට පෙර සහ පසුව කුඩා ළමුන් හා සුරතල් සතුන් එම ස්ථානයෙන් ඉවත් කරන්න
- සම්පූර්ණ ශරීරය ආවරණය වන පරිදි ආරක්ෂක ඇඳුම් හා උපකරණ භාවිතා කරන්න.



- සුළං හමන දිශාවට ලම්බකව ගමන් කරමින් ඉසින්න



- තද අව් රශ්මිය,වර්ෂාව හා දැඩි සුළං සහිත අවස්ථා වල ඉසීම සිදු නොකරන්න.
- නිවස අසල පළිබෝධනාශක ඉසින විට දොර ජනේල වසා තබන්න.
- ඉසින අතරතුර ආහාර ගැනීම, තේ පානය හෝ දුම්පානය නොකරන්න.

